THESIS SUBMITTER FOR THE DEGREE

OF

DOCTOR OF PHILOSOPHY

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
24 APR 2015
UNIVERSITY OF KELANIYA

# கொழும்புச் செட்டிமார் பாவிக்கும் தமிழ், யாழ்ப்பாண, இந்தியப் பேச்சுத் தமிழிலிருந்து வேறுபடும் விதம்பற்றிய ஒப்பீட்டு மொழியியல் ஆய்வு

# කොළඹ හෙට්ටි ප්‍රජාව භාවිත කරන භාෂාව : යාපනයේ දෙමළ හා ඉන්දියානු දෙමළ ආශ්‍රිත ව කෙරෙන තුලනාත්මක අධ්‍යයනයක්

# THE LANGUAGE USED BY COLOMBO CHETTI COMMUNITY: A COMPARATIVE STUDY WITH JAFFNA TAMIL & INDIAN TAMIL

STANISLAUS JOSEPH YOGARAJAH

DEPARTMENT OF LINGUISTICS

UNIVERSITY OF KELANIYA

2014

FGS/04/01/04/2005/03

# සාර සංග්‍රහය

කොළඹ හෙට්ටි සමාජය භාවිත කරන දෙමළ භාෂාව මෙම පර්යේෂණය සඳහා තෝරා ගෙන තිබේ. කොළඹ හෙට්ටි ප්‍රජාව ශ්‍රී ලාංකික සමාජයේ සෙසු ජන කොටස්වලින් වෙන් වූ විශේෂිත ජන කොටසකි. ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 150,000කට වඩා වැඩි පිරිසක් කොළඹ හෙට්ටි ප්‍රජාව ලෙස සැලකේ. ඔවුන් අයත් වන්නේ ධන වෛශ්‍ය **(Tana Vaisya)** කුලයට ය. වෛශ්‍යයන් ප්‍රධාන කොටස් 03කට බෙදේ. මෙයින් ධන වෛශ්‍යයන් උසස් කුලයට අයත් වූ අතර පූ වෛශ්‍ය **(Poo Vaisya)** හෙවත් ගොවිතැන් කරන්නන් සහ කෝ වෛශ්‍යයන් **(Ko Vaisya)** හෙවත් එඬේරුන් අනෙක් කුල දෙකට අයත් වේ. හෙට්ටි ප්‍රජාව වශයෙන් සැලකෙන්නේ ධන වෛශ්‍යයන් ය.

හෙට්ටි යන නාමය 'සෙට්ටි', 'සිට්ටු' හෝ 'එට්ටි' යන මූලයන්ගෙන් බිඳී ආ බව පිළිගැනේ. මේ වචනවලින් ගම්‍ය වන අරුත වන්නේ ධනවත් වෙළෙන්දන්, කඩ හිමියන් හෝ බැංකුකරුවන් යන්නයි.

මෙම ජන කොටසේ මුල්කාලීන මුතුන්මිත්තන් දේශපාලන වියවුල් හේතුවෙන් ඉන්දියාවේ වයඹදිග ප්‍රදේශවල සිට මලබාර් සහ කොරමැන්ඩල් වෙරළ ඔස්සේ දකුණට සංක්‍රමණය වී තිබේ. ඔවුන් ශ්‍රී ලංකාව හා වෙළඳ සබඳතා පැවැත්වීම අරඹා ඇත්තේ දකුණු ඉන්දියාවේ සිට ය.

මෙම පර්යේෂණය මීගමුවේ වැලිහේන ප්‍රදේශයේ ජීවත්වන කතෝලික හෙට්ටි ජනතාව භාවිත කරන භාෂාව ආශ්‍රිත ව සකස් වී තිබේ. මෙතෙක් කිසිවකු විසින් පර්යේෂණයට භාජනය නොවූ මාතෘකාවක් බැවින් හා යාපනයේ දෙමළ හා ලංකාවේ භාවිත වන ඉන්දියානු දෙමළ හා වෙනස් වන බැවින් මා මෙම මාතෘකාව මගේ පර්යේෂණය සඳහා තෝරා ගන්නා ලදී.

කේරල ප්‍රාන්තයේ භාවිත කරන දෙමළෙහි බලපෑමත් සිංහල භාෂාවේ බලපෑම් මෙහි දක්නට ලැබේ.

මෙම පර්යේෂණය පරිච්ඡේද හතරකින් සමන්විත වේ. උච්චාරණය, ව්‍යාකරණ, වාග්කෝෂය වශයෙන් මේවා එකින් එක වෙනස් වන ආකාරය මෙම නිබන්ධය මගින් සාකච්ඡා කෙරේ.